# යුද්ධයෙන් අවතැන් වූ උතුරු හා නැගෙනහිර පුරාවිද්‍යා උරුම කළමනාකරණය

චිත්‍රා දඹදෙණිආරච්චි[1]

පුරා වසර තිහක් තිස්සේ පැවති ජනවාර්ගික යුද්ධය ශ්‍රී ලංකාවේ සියලුම අංශ කෙරෙහි ඍජු සහ වක්‍ර බලපෑම් ඇති කරවයි. යුද්ධය පවතින උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි පුරාවිද්‍යා ස්මාරක කෙරෙහි ද මේ තත්ත්වය එසේමය. මෙම ප්‍රදේශයන්ට යටත්ව වර්තමාන දිස්ත්‍රික් බෙදීමට අනුව උතුරු ප්‍රදේශයට යාපනය, මන්නාරම, වව්නියාව, මුලතිව් සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක අයත් වේ. නැගෙනහිර ප්‍රදේශයට ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක අයත් වේ. මෙම ප්‍රදේශය පුරාවටම පුරාවිද්‍යාත්මක ස්ථාන විශාල වශයෙන් පැතිරී පවතී. මේවා ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික සහ ඓතිහාසික යුගවලට අයත් ය. ඒ අතර මූල බ්‍රාහ්මී සෙල්ලිපි ඇතුළත් පුරාවිද්‍යා ස්මාරක විශාල ප්‍රමාණයක් ස්ථානීය නාමාවලියට ඇතුළත්ව ඇත.

මෙම උරුමයන් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව දැඩිව පවතී. පුරාවිද්‍යාත්මක උරුම කළමණාකරණය න්‍යායාත්මක සහ ප්‍රායෝගික විෂය පථයකි. එහි ආරම්භය ලෙස ක්‍රි.ව 1666 දී ස්වීඩනයේ රාජකීය ප්‍රඥප්තිය හැඳින්විය හැකිය. සියලුම පෞරාණික වස්තූන් රජයේ දේපල බවට පත්කරමින් ආරම්භ වූ උරුම සංකල්පය යුරෝපීය පුනරුදයත් සමග දැඩිලෙස ප්‍රායෝගික මුහුණුවරක් ගනිමින් විවිධ වූ හේතූන් පදනම් කරමින් අණපනත්, ප්‍රඥප්ති සහ න්‍යායාත්මක හේතූන් සමග, ලෝක ප්‍රජාවගේ අවධානයට භාජනය වී ඇත.

ශ්‍රී ලංකාවේද උරුම කළමනාකරණයේ විශිෂ්ටත්වය හමුවේ, උරුම හතක් ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කර ඇත. මෙයින් පුරාවිද්‍යා ස්මාරකයන් හයකි. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ විනාශයට පත්වූ පුරාවිද්‍යා ස්මාරක ලෝක උරුමයන්

---

[1] අභිලේඛන හා නාණකවිද්‍යා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07

බවට පත් කරගැනීමට කටයුතු කිරීම ශ්‍රී ලාංකික උරුම කළමනාකරණයේ වගකීමකි.

පුරාවිද්‍යා ස්මාරක ගවේෂණය, පර්යේෂණ කිරීම සහ ස්මාරක හඳුනා ගැනීම, සිදුවී ඇති හානි අධ්‍යයනය කිරීම, හානි වූ ස්මාරක සංරක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම, සහ නඩත්තු කිරීම, හානි නොවූ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදනය සහ නඩත්තු ක්‍රියා මාර්ග ගැනීම, උරුම කළමනාකරණයේ විවිධ වූ අංගයන් ය. පුරාවිද්‍යා ස්මාරකයන්හි තථ්‍යතාව අධ්‍යයනය කිරීමත්, එකිනෙක ස්මාරකයන්ගේ පුරාවිද්‍යාත්මක ආගමික, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථිකමය වටිනාකම් හඳුනාගෙන ඒ අනුව පුරාවිද්‍යා උරුම කළමනාකරණයට අවශ්‍ය ක්‍රියා පිළිවෙත් සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම යුද්ධයෙන් අවතැන් වූ පුරාවිද්‍යා උරුමය කළමනාකරණය කිරීමට පියවර ගත හැකිය.

**ප්‍රමුඛ පද:** උතුර හා නැගෙනහිර උරුම කළමනාකරණය, ප්‍රාග් ඉතිහාසය, බ්‍රාහ්මී ශිලා ලිපි

**Title:** Managing heritage sites in the Northern and Eastern Provinces under war conditions

**Keywords:** Northern and Eastern Provinces, heritage management, prehistory, Brahmi inscriptions